# සුළු අපනයන බෝග වගාව හා ග්‍රාමීය සේවා වියුක්තිය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ඩබ්. එච්. වරත්තෙන්න**[1]
**නවරත්න බණ්ඩා**[2]

**සංක්ෂේපය**

තේ, පොල්, රබර් යන ප්‍රධාන කෘෂි භෝග හැරුණු විට අපනයනය කළ හැකි සියලුම කෘෂිකාර්මික බෝග සුළු අපනයන භෝග වශයෙන් හැඳින්විය හැකි අතර එම භෝග වර්ග සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන භෝග වශයෙන් හැඳින්විය හැකිය. වර්තමානය වන විට ග්‍රාමීය වශයෙන් මෙන්ම නාගරික වශයෙන් ද පවත්වාගෙන යනු ලබන සුළු අපනයන බෝග වගාව ශ්‍රී ලංකාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩි වශයෙන් දැකිය හැකි වේ. ග්‍රාමීය වශයෙන් සේවා වියුක්තිය ද ගැටලුකාරී තත්වයක පවතින අවස්ථාවේ සුළු අපනයන භෝග වගාව මගින් එම ගැටලුකාරී තත්වය අවම කළ හැකිද යන්නත් එම වගාව මගින් ග්‍රාමීය සේවා වියුක්තියට වන බලපෑම කුමක්ද යන්නත් විමර්ශනය කිරීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වේ. මෙහිදී කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් තුනක් වන ගන්තුන උතුර බී , ගන්තුන දකුණ ඒ හා බෙලිහුල්වාන සී, යන අධ්‍යයන ප්‍රදේශ මුල් කරගනිමින් එක් ග්‍රාම සේවා වසමකින් අවම වශයෙන් පවුල් ඒකක පහළවක්වත් අයත් වන පරිදි ඒකක පනහකට පමණ ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම මගින් හා සම්මුඛ සාකච්ඡා කිරීම මගින් දත්ත හා තොරතුරු ලබා ගන්නා ලදී. මෙලෙස ලබා ගන්නා තොරතුරු හා දත්ත වගු හා ප්‍රස්තාර සටහන් මගින් දැක්වීම තුළින් විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයේදී ලබා ගන්නා ප්‍රතිඵල වශයෙන් තොරා ගන්නා නියදියට අදාළව සුළු අපනයන බෝග වගාවේ යෙදෙන පවුල් ඒකක සංඛ්‍යාවට වඩා වගාවේ නොයෙදෙන පවුල් ඒකක සංඛ්‍යාව වැඩි අතර මෙම නියැදියට අදාළව සේවා වියුක්ති තත්වයේ පසුවන පුද්ගලයින්ද ජීවත් වන අතර ඔවුන් සුළු අපනයන බෝග වගාව කෙරෙහි යොමු වීමක් දැකිය නොහැකිය. ප්‍රදේශයේ ගොවි උපදේශකවරුන් හා නියැදියට අදාළ පුද්ගලයින් සමග සිදු කරන ලද සාකාච්ඡාවලදී හා ඔවුන්ට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියෙන් ලද පිළිතුරු වලට අනුව ඔවුන් සුළු අපනයන බෝග වගාව කෙරෙහි පවතින රුචිකත්වය හා දැනුවත්භාවය අවම බව පැහැදිලි විය. මේ අනුව මෙම අධ්‍යයනයේදී අවසාන වශයෙන් නිගමන කළ හැක්කේ ග්‍රාමීය සේවා වියුක්තිය අවම කිරීමට සුළුඅපනයන බෝග වගාවෙන් ලැබෙන දායකත්වය ඉතා අල්ප බවත් එම බෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වඩා ප්‍රතිඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

---

1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව